කවරයේ කතාව



# මිහිතලය අපට අහිමි වේ ද?

**දැ වෙමින් පවතින අපගේ මිහිතලය ඉක්මන් ප්‍රතිකාරයක් අපේක්ෂාවෙන් සිටියි. යෝධ හිමතලා දිය වී යයි. මුහුදු මට්ටම ඉහළ නැඟෙයි. එහෙත් වගකීම සියතට නොගෙන අපි තවමත් බලා සිටින්නෙමු.**

පෘථිවියේ භාරකාරත්වය මිනිස් සංහතිය සතු වන බව සිතීමත් අපට ආඩම්බරයකි. චින්තන ශක්තිය, උසස් ගණිත හා විද්‍යා දැනුම, අප අනිකුත් සතුන් අතරින් අග්‍රගණ්‍ය බවට පත් කරවන්නකි. එහෙත් මිනිසා තවත් එක් සත්ත්වයෙක් පමණි. අන් සියලු සතුන් තුළ ම පවතින අදූරදර්ශි බව, ප්‍රචණ්ඩත්වය ආහාර සම්පත් හා භූමිය සඳහා වන තණ්හාව මෙන්ම අපරීක්ෂාකාරී වීම ද මිනිසාට ද පොදුය.

ගෝලීය උණුසුම් වීම පාලනය කිරීමට අප තවමත් සූදානම් නැත. ගංවතුර, ලැව් ගිනි, මෙන්ම සත්ත්ව විශේෂ වඳ වී යාමට ලක්වීම වැනි ඛරුණු ගෝලීය උණුසුම් වීමේ ප්‍රතිඵල නොවේ යැයි සිතන පිරිසක් ද අප අතර සිටී. මේ සියල්ල මධ්‍යයේ මිහිතලයේ උණුසුම දිගින් දිගටම ඉහළ යමින් පවතියි. ගෙවුණු 2006 වසර, බ්‍රිතාන්‍ය වාර්තාවලට අනුව, උෂ්ණත්වය අධික ම වසරයි.

දේශගුණ වෙනස් වීම පිළිබඳ එක්සත් ජාතීන් ගේ අන්තර්රාජ්‍ය සභාව පසුගිය පෙබරවාරි මස දී වාර්තාවක් එළිදැක්විය. දේශගුණ පද්ධතියේ උණුසුම් වීම ඉතා පැහැදිලි බවත්, ඒ පිළිබඳ නිවැරදි තීරණයකට එළැඹීමට ඇති නොහැකියාවත්, වාර්තාව මඟින් අවධාරණය කෙරේ. වායුගෝලය, කාබොන්ඩයොක්සයිඩ් වායුවෙන් පිරවීම ආරම්භ වූයේ 1750 සිටය. මානව ක්‍රියාකාරකම් එහි දී ප්‍රබල දායකත්වයක් ලබා දෙයි.

මේ නිසා විකිරණය කර ආපසු අභ්‍යවකාශයට ම යැවිය යුතු වූ සූර්ය කිරණ වායුගෝලය තුළම රැඳවිණි. වාර්තාව අවසන් වන්නේ Co මට්ටම අඩු කිරීමේ දීර්ඝ කාලීන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම එකම විසඳුම වුවත්, අප දැන් කරමින් සිටින්නේ උස් බිම්වලට සංක්‍රමණය වීම වැනි විචල්‍ය දේශගුණ සංසිද්ධිවලින් මිදීමේ උපක්‍රම අනුගමනය කිරීම පමණක් බව සඳහන් කරමිනි. මාර්තු 21 දින දේශගුණ වෙනස්වීම පිළිබඳ ඇ.එ.ජ. කොංග්‍රසය ඉදිරියේ කරුණු පැහැදිලි කළ හිටපු ඇමරිකානු උප ජනාධිපතිවරයකු වූAl Goreතම දෙසුම අවසන් කළේ දැඩි විධානයක් ද සමඟිනි. "අපට තවත් හිතන්න තරම් වෙලාවක් ඉතිරි වී නැහැ."

"ප්‍රතික්ෂේප කිරීමට ඉතා අමාරු තලයකට විද්‍යාව පැමිණ සිටිනවා. ඇ.එ.ජ. යේ පාරිසරික ආරක්ෂ ඒජන්සියේ හිටපු කළමණාකාරවරයකු වන ටොඩ් විට්මන් පවසා සිටී. එය සත්‍යයකි. 2005 වර්ෂයේ දී එය වායු අණු මිලියනයකට තිබූ Co අණු ප්‍රමාණය කොටස් 379 කි. ගෙවුණු වසර 650000 දී වාර්තා වූ ඉහළ ම මට්ටමයි. උෂ්ණත්වය අධික ම වසර 12 න් 11 ක්ම වාර්තා වූයේ 1995 - 2006 කාලය තුළ දීය. ගෝලීය උණුසුම් වීම නම් රෝග විනිශ්චය සාර්ථක වී තිබේ. එසේ නම් ඊට ප්‍රතිකාරයක් ද අවශ්‍ය ය. එක් එක් පුද්ගලයන් වශයෙන් කළ හැකි දෙයක් නැති බව පැහැදිලිය. එහෙත් රාජ්‍ය හා කර්මාන්ත මෙහි දී මූලිකත්වය ගත යුතු ය.

සීමිත වුණද තනි පුද්ගලයන් ලෙස අපට ක්‍රියාත්මක කළ හැකි ප්‍රතිපත්තිද පවතියි. රථය සඳහා Carbon Offsets මිල දී ගෙන දීර්ඝ ගමනක දී වායුගෝලයට ඇතිවන බලපෑම අඩු කළ හැකි ය. පැළ සිටුවීම ඊටත් වඩා වැදගත් ය. එහෙත් ලෝකයේ ඇතැම් කලාපවල ආලෝකය අවශෝෂණය කරන ශාක පත්‍ර මඟින් තාපය රඳවාගෙන උෂ්ණත්වය ඉහළ නැංවීමට ක්‍රියා කරයි.



මෙහිදී වත්මන් තත්ත්වය අනුව ඉතාම එලදායි පුද්ගල ක්‍රියාකාරකම් වුවද නොසෑහෙන බව පෙනීයයි. පසුගිය වසර 250 තුළ අප ඉලක්ක කළේ කාර්මික දියුණුව පමණි. එමඟින් ශේෂ වූ විනාශකාරී සුන්බුන් පවිත්‍ර කිරීම, පොසිල ඉන්ධන සඳහා ඇබ්බැහි වූ සමාජයකට ඉතා අසීරු කාර්යයකි. එහෙත් සමාජයේ සියලු වගකිවයුත්තන් දැන් දැන් අවදිවන බව පෙනේ. විද්‍යාඥයන්ගේ සිට නගර නිර්මාණකරුවන් දක්වාත් ගෘහ නිර්මාණකරුවන් ගේ සිට නීති සම්පාදකයන් දක්වාත් මෙම වෙනස හටගෙන තිබේ.



### විද්‍යාඥයන් ගේ විසඳුම්

වායුගෝලයේ කාබන් ප්‍රතිශතය ඉහළ යාමේ හේතු ඉතා පැහැදිලි ය.පසුගිය වසරේ පමණක් ගෝලීය කාබන් ප්‍රතිදාන මට්ටම බිලියන 32 ක් විය. ඉන් 25% ක් ම ඇ.එ.ජ.ය සතුවෙයි. විසඳුම් අතරින් කාබන් ප්‍රතිශතය අඩු කිරීම පළමු පියවර වේ. ඒ සඳහා වන විකල්ප ද කාලයක් මුළුල්ලේ අපට සමීප වූ ඒවා ය. සුළං මෝල් සූර්ය පැනල මෙන්ම න්‍යෂ්ටික යන්ත්‍ර සූත්‍ර ඒ අතර වෙයි. මෙම තාක්ෂණ ත්‍රිත්වයම බලශක්තිය මිශ්‍ර වූ ඒවා වන අතර, ඇතැම් අඩුපාඩුකම් ද පවතියි. සුළං මෝල්වලින් අධික ශබ්දයක් ද න්‍යෂ්ටික ආයුධවලින් විකිරණශීලි අපද්‍රව්‍ය ද පිටවෙයි.

ජීව ඉන්ධන දැනට වේගයෙන්ම දියුණුවන තාක්ෂණය යි. ඇ.එ.ජ.යේ මෙම තත්ත්වය ඇති වූයේ ජනාධිපති ජේ.ජී.ඩබ්ලිව්.බුෂ් මහතා ජීව ඉන්ධන භාවිතය 5 ගුණයකින් වැඩි කළ යුතු යැයි යෝජනා කිරීමත් සමඟ ය. මූලික වශයෙන් ම අවධානය යොමු වූයේ එතනෝල් පිළිබඳවය.

ඇමරිකාවේ ඉරිඟු ගොවීන්ට මෙය සුභ ආරංචියක් විය. ඒ ඔවුන් ඉරිඟු නිෂ්පාදන යොදා ගනිමින්ම ගෘහස්ත එනතෝල් නිපදවීම සිදු කරන බැවිනි. එහෙත් තවමත්, ඉරිඟු මඟින් එතනෝල් නිපදවීම අකාර්යක්‍ෂම තත්ත්වයක පවතියි.

මීට වඩා හොඳ විසඳුමක් වූයේ උක්දඬු මගින් එනතෝල් නිෂ්පාදනය කිරීමයි. ලබාදෙන ශක්තිය මෙන් 8 ගුණයක ප්‍රමාණයක් උක්දඬු මගින් ලැබෙන අතර බ්‍රසීලයේ ඉන්ධන ශක්තියෙන් 40% ක්ම උක්දඬු භාවිත කර ලබා ගනී. එහෙත් මේ නිසා පාරිසරික ගැටලු නිර්මාණය වේ. උක් වගා කිරීම සඳහා වනාන්තර හෙළි පෙහෙළි කිරීම ඉන් එකකි.

උක් දඬු හෝ ඉරිඟු වෙනුවට භාවිත කළ හැකිවෙනත් අමුද්‍රව්‍ය ද තිබේ. උදා: කෘෂිකාර්මික අපද්‍රව්‍ය වන දර පතුරු, උතුරු ඇමරිකාවේ Swithgrassනම් තණකොළ වර්ගයක්ද පාවිච්චි කෙරේ. තණ පත්‍ර හා දර පතුරු ආශ්‍රය කරගෙන නිපදවන එතනෝල්වල ඉරිඟු එතනෝල්වලට වඩා ශක්තියක් අඩංගු නමුත් ඒවා නිෂ්පාදනයට වැඩි ශක්තියක් ද අවශ්‍ය වේ.

කාබන් භාවිතය සම්පූර්ණයෙන් නතර කරන තුරු දැනට වායු ගෝලයට එක්වන කාබන්, එසේ එකතුවීම වළක්වා ගැනීමට ක්‍රමයක් තිබිය යුතුය. භූමිය තුළ වළලා දැමීම දැනට පවතින යෝග්‍ය ක්‍රමයකි. න්‍යෂ්ටික ප්‍රතික්‍රියා නිසා ඇතිවන විකිරණශීලි අපද්‍රව්‍යවලට ද අත්වන්නේ මෙම ඉරණමයි. බලාගාරවලින් පිට කෙරෙන COවායුඅණු ද භූගත කිරීම කළ හැකි ය. මීට අවශ්‍ය ආරක්ෂාකාරී ස්ථාවර භූ ස්ථර පෘථිවිය තුළ දක්නට ලැබේ. නිවෙස් තාපවත් කිරීමටත්, කර්මාන්තශාලාවලදීත් යොදා ගන්නා ස්වාභාවික වායු පෘථිවිය තුළ පවතින්නේ ලවණ සහිත වැලි ගල් හා හුණු ගල් ස්ථර අභ්‍යන්තරයේය. ඒවායේ ඇති ස්පොන්ජ්වල මෙන් වූ සියුම් සිදුරු වායු රඳවාගෙන ගබඩා කර තබයි. මෙම වායු නළ මඟින් ඉහළට ගත් පසු ඉහත කුටීර හිස් වෙයි. එම කුටීර හා පාෂාණ ස්ථර සිතියම් ගත කරන බැවින් ඒවා වෙත නැවත කුමක් හෝ භූගත කිරීම ඉතා පහසුය.

ඇ.එ.ජ.යේ බලශක්ති දෙපාර්තමේන්තුව මෙවැනි වායු ගත කිරීමේ පර්යේෂණ කීපයකට අරමුදල් සපයයි. මීළඟ ගිම්හානයේ දී කැලිෆෝනියාවේ තෝරින්ටෝන්හි පිහිටි වැලිගල් උප ස්ථරයකට CO ටොන් 220 ක් එන්නත් කරනු ඇත. පර්යේෂකයන් පවසන පරිදි ඒවා සදාකාලිකව භූතලය තුළ පවතියි.

එහෙත් එම ක්‍රමය ආරක්ෂාකාරී ද ? CO මාරාන්තික වායුවකි. 1986 දී කැමරූන්හි නියොස් විල තුළින් ක්ෂණිකව මතු වූ CO වායුව 1700 දෙනකු නිදි යහනේ දී ම ඝාතනය කළේ ය. එහෙත් තෝරින්ටන් ව්‍යාපෘතියේ කිසිදු අවදානමක් නැතැයි විද්‍යාඥයෝ පවසති. "එම භූමිය ශත වර්ෂ ගණනාවක් ම තෙල් හා වායුව ගබඩා කරගෙන සිටියා". කැලිෆෝනියාවේ බ්රිකලී පර්යේෂණාගාරයේ භූ විද්‍යාඥයකු වන ලැරී මේයර් පවසයි. ඔහු මෙම ව්‍යාපෘතියේ අධ්‍යක්ෂවරයා ද වෙයි. "භූ විද්‍යාත්මකව CO වායුව ද දරාගත හැකි බව අපට විශ්වාසයි.

**ගෘහ නිර්මාණ ශිල්පය** - නගරයක් සිසාරා දක්නට ලැබෙන උස් ගොඩනැගිලි ගෘහ නිර්මාණ ශිල්පයේ මෙන්ම, රටක දියුණුව ද පත් කර ගන්නා ඉඩ ප්‍රමාණය පරිසරයට මිනිසාගෙන් එල්ල වන බලපෑම මතුකර පෙන්වයි.

**කාබන් භාවිතය සම්පූර්ණයෙන් නතර කරන තුරු දැනට වායු ගෝලයට එක්වන කාබන්, එසේ එකතුවීම වළක්වා ගැනීමට ක්‍රමයක් තිබිය යුතුය. භූමිය තුළ වළලා දැමීම දැනට පවතින යෝග්‍ය ක්‍රමයකි. න්‍යෂ්ටික ප්‍රතික්‍රියා නිසා ඇතිවන විකිරණශීලි අපද්‍රව්‍යවලට ද අත්වන්නේ මෙම ඉරණමයි. බලාගාරවලින් පිට කෙරෙන CO වායුඅණු ද භූගත කිරීම කළ හැකි ය. මීට අවශ්‍ය ආරක්ෂාකාරී ස්ථාවර භූ ස්ථර පෘථිවිය තුළ දක්නට ලැබේ.**

වර්තමානය වන විට පරිසර හිතකාමී ආකාරයෙන් ගොඩනැගිලි ඉදි කිරීම ගෘහ නිර්මාණ ශිල්පීන් උත්සාහ කරන්නේ එම නිසා ය. ඇ.එ.ජ.යේ සැන් ෆ්‍රැන්සිස්කෝ හි දක්නට ලැබෙන තට්ටු 18 ක් සහිත නව පෙඩරල් කුළුණ ඊට උදාහරණයකි.

එහි බිම් මහලේ කෘත්‍රිම තාපවත් කිරීම හා සිසිල් කිරීම 70% කින් අඩු කර තිබේ. දිවා කාලයේ දී හැකි තාක් දුරට ස්වාභාවික ආලෝකයට ගොඩනැගිල්ල තුළට වැටීමට සලස්වයි. නිතරම ඇරෙන වැසෙන ජනේල ද, උණුසුම හා දැඩි හිරු එළිය පෙරා හරින තටු මෙන් වූ ආවරණ ද කුළුතා සුවිශේෂී ලකෂණ අතර වේ.

මෙවැනි ඉදි කිරීමකට ඉහළ වටිනාකමක් හිමිවේ. ඇ.එ.ජ.යේ නිවෙස්වලින් හා වෙනත් ගොඩනැගිලිවලින් විමෝචනය වන Co ප්‍රමාණය මුළු Co ප්‍රතිශතයකින් 38% කි. 20 වැනි සියවසේ මැද භාගයේ දක්නට ලැබුණු ගොඩනැගිලි තාක්ෂණය මීට හේතු විය. අඩු උණුසුමක් සහිත ප්‍රතිදීප්ත පහන් මෙන්ම අධි බල වායු සමන ක්‍රම, ඕනෑම කාලගුණ සංසිද්ධියකට මිනිසුන් හුරු කරවීය. එහෙත් ඒවා මඟින් ස්වාභාවික පරිසරයට එල්ල වූයේ දැඩි බලපෑමකි.

මීට ප්‍රතිවිරුද්ධ ලෙස, නව ෆෙඩරල් ගොඩනැගිල්ල පරිසර හිතකාමී ලෙස නගරය මැද නැගී සිටියි. පරිගණක අනුසාරයෙන් ක්‍රියාත්මක වන පොළවේ වා සිදුරු උෂ්ණත්ව වෙනස්වීම්වලට අනුකූලව ස්වයංක්‍රීයව වැසීම හෝ ඇරීම දක්නට ලැබේ. ගොඩනැගිල්ල ඇතුළත කුටි වෙන් කර තිබෙන්නේ ඉතා අඩුවෙනි. එමඟින් වායුව නිදහසේ සංසරණය වෙයි. හිරු එළිය පෙරා හරින ස්වයංක්‍රීය පැනල වායුවට ගොඩනැගිල්ල වටා සැරිසැරීමට අවකාශය ලබා දෙයි."ගොඩනැගිල්ලකට අක්‍රීය මෙන්ම ක්‍රියාකාරී වායුව ද භාවිත කළ හැකියි." ගෘහ නිර්මාණ ශිල්පී තොම් මේන් පවසයි. ෆෙඩරල් කුළුතා නිර්මාණය කළේ ඔහු සේවය කරන Firm Morphosis ආයතනයයි.

හරිත ගොඩනැගිල්ලක් (Green Building) ඉදි කිරීමට සෑන් ෆැන්සිස්කෝ වැනි නගරයක් ඉතා සුදුසු ය. නියම උෂ්ණත්වයක් පවත්වා ගැනීමට එහි ඇති සෞම්‍ය කාලගුණය රුකුල් දෙයි. එහෙත් ගිම්හානයේ 38% C ද ශීත සෘතුවේ දී – 10C ද වැනි උෂ්ණත්ව විචලතාවලට ලක්වන නිව්යෝක් වැනි නගරයක් ගොඩනැගිල්ලකට කෙතරම් සුදුසු ද ? 288M උස ඇමරිකානු බැංකු ගොඩනැගිල්ල මෙම අභියෝගයට මුහුණ දීමට සැරසෙයි. සුළං බලයත්, ප්‍රතිසංස්කරණය කළ උෂ්ණත්වයත්, ගොඩනැගිල්ල තුළ ශක්තිය නිපදවීමට භාවිතා කෙරේ. උස් සිවිලිම් සහ ආවරණික විදුරු, උෂ්ණත්වය අඩු කරන අතර, ලැබෙන හිරු එළිය උපරිම තත්ත්වයට පත් කරයි.

හරිත ගොඩනැගිලි නිර්මාණය කිරීම එතරම් අපහසු නැත. සාමාන්‍ය ගොඩනැගිල්ලකට වඩා එම ගොඩනැගිල්ලකට වැය වන මුදල වැඩි වන්නේ 5% ක් පමණි.

The Green Company ස්වාභාවික පරිසරය පිළිබඳ ඉහළම සැලකිල්ලක් දක්වන ආයතන අතර Wal - Mart ආයතනය ඉදිරියෙන් සිටියි. සූර්ය පැනල භාවිත කිරීම පරිසර හිතකාමී රථ වාහන මිලදී ගැනීම, මෙන්ම ජල සම්පත් සංරක්ෂණයටත් එය දැන් යොමුවී තිබේ. තවද Wal - Mart නියෝජිතයෝ 60000 ට වැඩි සැපයුම්කරුවන් පිරිසක් සමඟ ඇසුරුම් අපද්‍රව්‍ය හා බල ශක්ති භාවිතය අඩු කිරීම පිළිබඳ සාකච්ඡා පවත්වාගෙන යති. පරිසර හිතකාමී පිළිවෙත් අනුගමනය කරන්නේ Wal - Mart පමණක් නොවේ. ඇ.එ.ජ.යේ දේශගුණ ක්‍රියාකාරී හවුල ජනවාරි මස දී ෆෙඩරල් රජයට පවසා සිටියේ දේශගුණ වෙනස්වීම් පිළිබඳ දැඩි ලෙස ක්‍රියාත්මක වීමට කාලය එළඹ ඇති බව ය. Alcoa BP America වැනි ලොව ප්‍රබල බලශක්ති පරිභෝජකයන් මෙම හවුලට ඇතුළත් වෙයි. හුදෙක් නීති හා සීමා පැනවීමෙන් පමණක් Co විමෝචන ප්‍රමාණය අඩු කළ නොහැකි බව ඔවුහු පෙන්වා දෙති.



පරිසර හිතකාමී පිළිවෙත් ක්‍රියාත්මක කිරීමේ විශාල ආයෝජන ආරම්භ කිරීමට පෙර, නියමාකාර නීතිමය සැලැස්මක් ඔවුන්ට අවශ්‍ය ය.

General Electric ආයතනය හරිත නිෂ්පාදන 45 ක් හඳුන්වා දෙයි. සුළං ටර්බයින, ජෙට් එන්ජින් ඊට ඇතුළත් ය. 1980 අග භාගයේ හා 1990 මුල් භාගයේ දී Dopont ආයතනය දරුණු බිඳ වැටීමකට ලක් වූයේ ක්ලෝරෝ ෆ්ලුවරෝ කාබන් CFO වායු නිෂ්පාදනය අවම කිරීමට සිදුවීමත් සමඟ ය. එහෙත් මේ වන විට ඔවුහු ද පරිසර හිතකාමී පිළිවෙත් කරා යොමු වී සිටිති. Dacron Lycra සහ Nylon නම් පොසිල ඉන්ධන මූලික කරගත් ගොඩනැගිලි ව්‍යුහ විකුණා දැමුණු අතර, ඒ වෙනුවට ඉරිඟු පිටි වලින් සාදන ලද Soronaනම් බහු අවයවක වැනි ජෛව මූලික ද්‍රව්‍ය භාවිත කිරීමට ඔවුන් තීරණය කර තිබේ. 1990 සිට Coකපා හැර තිබෙන ප්‍රමාණය 72% කි.

**දේශපාලන තත්ත්වය**

ඔක්ලහෝමා හි රිපබ්ලිකන් පාක්ෂිකයකු වන ජේම්ස් ඉන්හොෆ් ඔහු සෙනෙට් සභාවේ පාරිසරික හා මහජන වැඩ සටහන් අංශයේ සභාපතිවරයාව සිටි කාලය තුළ දේශගුණ වෙනස්වීම් පිළිබඳ වැඩසටහන් හතරක් සංවිධානය කළේ ඉන්හෝෆ් ගෝලීය උණුසුම් වීම දුටවේ"ඇමරිකානු වැසියන්ට යොමු කළේ විද්‍යා ප්‍රබන්ධ රචකයකු වන මයිකල් ක්‍රිච්ටන් ය. හෙතෙම ගෝලීය උණුසුම් වීමේ න්‍යාය විවේචනය කරන්නෙකි. දැන් එම තනතුර දරන්නී කැලිෆෝනියාවේ බාබරා බොක්සර්ය.ඇය සභාපතිනිය වශයෙන් හරිත පනත් කීපයකට සහාය දෙනු ඇතැයි ඇමරිකානු ජනතාව බලාපොරොත්තු වෙයි. මිචිගන්හි ඩිමොක්‍රටික් පක්ෂිකයකු වන ජෝන් ඩින්ගල්ටCo වායුව පිළිබඳ ගැටලුවේදී වැදගත් කාර්යභාරයක් හිමිවේ. බලශක්ති හා වාණිජ කමිටුවේ නව සභාපතිවරයා වන ඔහු නියෝජනය කරන ප්‍රාන්තය මෝටර් රථ කර්මාන්තය සඳහා ප්‍රසිද්ධ ය. ස්වකීය කර්මාන්තයට බලපාන ඕනෑම අභියෝගයක් ක්ෂණිකව බැහැර කරන්නට එහි වැසියෝ සූදානම්ව සිටිති. ඒ යටතේ නව සභාපතිවරයා ද සූදානමින් සිටිනේනේ ඕනෑම පනතක සාධාරණත්වය කෙතරම්දැයි පුළුල් ලෙස සලකා බැලීමට ය.

ඇ.එ.ජ.යේ බොහෝ ප්‍රාන්ත ආණ්ඩුකාරවරු කොංග්‍රසය ක්‍රියාත්මක වන තුරු බලා නොසිටිති. කැලිෆෝනියාවේ ආණ්ඩුකාර ආනෝල්ඩ් ස්ක්වාසෙන්ගර් 2020 වන විට ප්‍රාන්තයේ Coවිමෝචන මට්ටම 20% කින් අඩු කිරීමට අරමුණු කරගෙන සිටියි. මීට විරුද්ධව ප්‍රාන්තයේ මෝටර් රථ නිෂ්පාදකයන් නඩු පවරා තිබේ. ඊට අමතරව පෙනිසිල්වේනියාව මේරිලන්ඩ් ඇතුළු තවත් ප්‍රාන්ත 9 ක් දCo වායු නිකුත් කිරීම සීමා කිරීම පිළිබඳ ප්‍රතිඥාවකට යොමු වී සිටී.

**ඉන්දියාව සහ චීනය**

1990 - 2004 කාලය අතරතුර දී ඉන්දියාවේ බලශක්ති පරිභොජනය 37% කින් ද චීනයේ 53% කින් ද ඉහළ නැගිණි. බීජිං හි මේ වන විට නව ගල් අඟුරු බලාගාරයක් ද ඉදි වෙමින් පවතියි. පසුගිය කාලයේ චීනයේ ආර්ථික වර්ධන වේගය 10% කින් ඉහළ ගිය අතර, 2010 වන විට ඔවුන්හරිතාගාර වායු නිකුත් කරන රටවල් අතර ප්‍රථම ස්ථානයට පැමිණෙනු ඇතැයි ද අනතුරු ඇඟවේ.

එමනිසා චීනය මේ වන විට සුළඟ හිරු එළිය වැනි අලුත් කළ හැකි සම්පත් බලශක්ති නිපදවීම සඳහා යොදා ගැනීමට පියවර ගනිමින් සිටියි. 2020 වන විට දේශීය බලශක්ති නිෂ්පාදනයෙන් 15% ක් නශ්‍ය නොවන සම්පත් මගින් ලබා ගත යුතු බවට නීතියක් ද සම්මත කරගෙන ඇත.

සංවර්ධනය වෙමින් පවතින රටක් වශයෙන් ඉන්දියාව බලශක්ති පරිභෝජනයේ ගුණාත්මක බව රැක ගැනීමට එතරම් සමත් වී නැත. හිරු එළිය හා සුළඟ වැනි නශ්‍ය නොවන සම්පත් අතිරික්ත ලෙස ඉන්දියාවට ලැබුණත්, ඉන් ප්‍රයෝජන ගෙන බලශක්තිය නිපදවන්නේ එක සමාගමක් පමණි. ඒSuzlonසමාගමයි. 2006 දී ඔවුහු සුළං මගින් ඇ.ඩො.බිලියන 1 - 5 ක් වටිනා විදුලි ධාරිතාවක් නිෂ්පාදනය කළහ. එහෙත් අඩු වර්ධන වේගයක් සහිත ආර්ථිකයකට උරුමකම් කියන ඉන්දියාව වැනි රාජ්‍යයකට බලශක්ති උත්පාදනය උදෙසා විශාල මුදලක් වැය කළ නොහැකි ය.

ගෝලීය උණුසුම් වීමේ ප්‍රතිඵල අපි මේ වන විට අත් විඳින්නෙමු. එහෙත් ඉක්මන් ප්‍රතිකර්ම යෙදීම පසෙක තබා තවමත් සිදුවන්නේ එකිනෙකාට ඇඟිල්ල දිගු කර ගැනීමයි. රට වැසියෝ පාලකයන්ට ද පාලකයෝ කර්මාන්තකරුවනට ද, සංවර්ධිත රටවල් සංවර්ධනය වෙමින් පවතින රටවලට ද දෝෂාරෝපණය කරති. එහෙත් නියම විසඳුමක් තවම ලැබී නැත. වසර බිලියන ගණනක් තිස්සේ නිර්මාණය වූ ග්‍රහලොව අපි පරම්පරා කීපයක් තුළ විනාශ කර දැමුවෙමු. සියල්ල නැවතත් යහපත් තත්ත්වයකට ගෙන ඒමට ද පරම්පරා ගණනාවක් ගත වන බව නිසැකය. එකම වෙනස වන්නේ ලෝකය කර්මාන්තපුරයක් වනු දැකීමේ සිහිනය සැබෑ කර ගැනීමට අප ඉතා ඉවසිලිමත්ව කටයුතු කළත්, විනාශ වූ ග්‍රහ ලොව නැවත ගොඩ නැගීමට අප තුළ ඉවසීමක් නොමැති වීමයි.

**දිනිති නිස්සංක**

